# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2010/32 - 2017 මාර්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2017.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

2 වන වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස, මාලඹේ නගර සංවර්ධන වැඩ සටහන යටතේ, වාණිජ සංකීර්ණය ඉදිකිරීම සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 මාර්තු මස 13 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ, පල්ලේපත්තුව හේවාගම් කෝරළෙයේ, තලංගම උතුර පිහිටි ඉඩමට අදාළව බලයලත් මිනින්දෝරු අනිල් නවගමුව මහතා විසින් ඇඳ ඇති අංක 2058 දරන සැලැස්මේ කැබලි අංක බී 1 වශයෙන් දක්වා ඇති රූඩ් 03 පර්. 17.50 ක් (හෙක්. 0.3478) පමණ වූ දොඹගහවත්ත නැමති ඉඩමට අදාළ මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| උතුරට | - | මාලඹේ බස්නැවතුම්පළ ඉඩම ; |
| නැගෙනහිරට | - | මාලඹේ බස්නැවතුම්පළ ඉඩම හා එස් සහ ජී දේපළ සංවර්ධනකරුවන්ගේ ඉඩම ; |
| දකුණට | - | උඩවත්ත පාර ; |
| බටහිරට | - | කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල. |

03 - 1253


1A - G 25284 — 17 (2017/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*